# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1782/28 - 2012 ඔක්තෝබර් 31 වැනි බදාදා - 2012.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත

3 වැනි උපවගන්තිය (4) උපවගන්තිය යටතේ කරන ලද නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආර්ථික සංවර්ධන අමාත්‍ය, බැසිල් රෝහණ රාජපක්ෂ වන මම, ආයෝජන හා සංචාරක විෂයභාර අමාත්‍යවරයා ද ලෙස මෙම නියමය මගින් :–

1. ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති සුඛෝපභෝගී හෝටලයක් ඇතුළුව මිශ්‍ර උපයෝගිතා සංකීර්ණයක් බස්නාහිර පළාතේ කොළඹ 01, කොටුවෙහි ඉදිකර ක්‍රියාත්මක කිරීමට අදාළ තොරතුරු සඳහන් නිවේදනය 2012 ජූලි මස 04 වැනි දින අංක 1765/7 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද බවත්,

2. සුඛෝපභෝගී හෝටලයක් ඇතුළුව මිශ්‍ර උපයෝගිතා සංකීර්ණයක් බස්නාහිර පළාත් කොළඹ 01, කොටුවෙහි ඉදිකර ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියට, ඉහත කී පනතේ 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බවත්,

3. ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය, "සුඛෝපභෝගී හෝටලයක් ඇතුළුව මිශ්‍ර උපයෝගිතා සංකීර්ණයක් බස්නාහිර පළාතේ කොළඹ 01, කොටුවෙහි ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය" ලෙස හඳුන්වනු ලැබිය යුතු අතර සීමාසහිත වෙල්කොම් හොටෙල්ස් ලංකා පුද්ගලික සමාගම ව්‍යාපෘති සමාගම වන බවත් ප්‍රකාශ කර සිටිමි.

4. සුඛෝපභෝගී හෝටලයක් ඇතුළුව මිශ්‍ර උපයෝගිතා සංකීර්ණයක් බස්නාහිර පළාතේ, කොළඹ කොටුවෙහි ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ඉහත කී ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ දෙනු ලබන සහනයන්/නිදහස් කිරීම් පාර්ලිමේන්තු යෝජනා සම්මතය අනුමත කිරීමේ දින සිට මාස හැට (60) ක කාලයක් තුළ ඇරඹිය යුතු බවත් ප්‍රකාශ කර සිටිමි.

5. මෙම නියමයේ උපලේඛනයේ සඳහන් නිදහස් කිරීම්, එහි සඳහන් සීමා කිරීම්වලට යටත්ව ව්‍යාපෘති සමාගමට අදාළ විය යුතු අතර එහි සඳහන් කාල සීමාව තුළ බලාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරමි.

*උපලේඛනය*

(*අ*) **2006 අංක 10 දරන දේශීය ආදායම් පනත :**

(i) වසර දහය (10)ක කාල සීමාවක් සඳහා ව්‍යාපෘති සමාගමේ බදු ගෙවිය යුතු ලාභය සහ ආදායම්, දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලින් නිදහස් වේ (බදු නිදහස් කාලය). එකී වසර දහය (10)ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එක (01)ක කාල පරිච්ඡේදයක් සඳහා ලාභවලින් කොටස්කරුවන් හට බෙදා දෙනු ලබන ලාභාංශ සඳහා බදු නිදහස ලැබේ.

(ii) එකී බදු නිදහස් කාලය ව්‍යාපෘති සමාගම බදු මත ලාභ උපයන මුල් වසරේ ආරම්භයේ සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර තුන (03) යන දෙකින් මුලින් එළඹෙන දින සිට ආරම්භ වේ.

(iii) ඉන්මතු බදු ඉහත (i) උප වගන්තියේ සඳහන් නිදහස් කාල පරිච්ඡේදයේ අවසාන දිනයට අනතුරුව එළඹෙන ඉක්බිති වසර පහළොව (15)ක් ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායමින් සියයට හය (6%)ක ප්‍රතිශතයක් හෝ හෝටල් කර්මාන්තයට අදාළ බදු අනුපාතයෙන් සියයට පනහ (50%)ක වන දෙකින් කවර හෝ අවම අනුපාතියකට අර්ධ නිදහස් කිරීමක් හිමි වේ (සහනකාරී බදු කාලය).

(iv) ඉහත විදහා පෙන්වා දී තිබෙන බදු නිදහස් කාල සීමාව සහ සහනකාරී බදු කාල සීමාව ඉකුත්වීමෙන් පසුව දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව එවිට බල පැවැත්වෙන සාමාන්‍ය බදු රාමුව, ව්‍යාපෘති සමාගමේ ලාභය සහ ආදායම් මත ආදායම් බදු ගෙවීම කෙරෙහි අදාළ වනු ඇත.

(v) සේවකයින් 20 දෙනෙකුගේ උපරිමයකට යටත්ව සමාගමේ ප්‍රවාසික සේවකයන් සම්බන්ධයෙන් උපයන විට ගෙවිය යුතු බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු නිදහස ව්‍යාපෘතිය වාණිජමය කටයුතු ඇරඹීමේ දින සිට වසර පහ (5)ක කාලයක් සඳහා වලංගු වනු ඇත. ව්‍යාපෘති සමාගම ප්‍රවාසික සේවකයන් දේශීය සේවකයන් මඟින් ක්‍රමාත්මකව ප්‍රතිස්ථාපනය කිරීමට උපරිම උත්සාහ ගත යුතු ය.

(vi) පහත සඳහන් විෂයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගමට නිදහස ලැබෙන අතර, ලැබුම්කරු දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු සියලුම ආදායම් බදුවලින් නිදහස් වේ.

(*අ*) ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය මත පොළිය,

(*ආ*) උපදේශකයින්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව,

(*ඇ*) දළ ආදායමින් 3% දක්වා කළමනාකරණ ගාස්තුව,

(*ඈ*) දළ ආදායමින් 1.5% දක්වා රාජ්‍ය භාග ගාස්තුව,

(*ඉ*) දළ ආදායමින් 1.5% දක්වා අලෙවිකරණ ගාස්තුව,

(*ඊ*) දළ මෙහෙයුම් ලාභයෙන් 10% දක්වා කළමනාකරණ දිරි දීමනා ගෙවීම්,

(*උ*) ITC සමාගම හෝ සමාගමේ සේවා සපයන්නන් විසින් මධ්‍යම සංචිත පද්ධතිය (“Central Reservation System”) තුළින් කරන වෙන් කිරීම් සඳහා අයකිරීම්, ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන දිනට අදාළ එකී වෙන්කිරීමක් සඳහා ඇමරිකානු ඩොලර් 5-6 පරාසයක පවතී.

(*ආ*) **2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** (VAT) :

මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආයනයන කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිලදීගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු සහනය මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියට/ව්‍යාපෘති සමාගමට සෘජුවම කරන සැපයුම් සඳහා පමණක් නොව ව්‍යාපෘති සමාගමේ අනුමැතිය පරිදි කොන්ත්‍රාත්කරුවකු වෙත උපකොන්ත්‍රාත්කරුවකු විසින් කරනු ලබන සැපයුම් සඳහා ද අදාළ වේ.

ව්‍යාපෘති සමාගම එකී වාණිජ කටයුතු ආරම්භ කිරීමත් සමඟම එකතු කළ අගය මත බදු පනත අනුව VAT බදු ගෙවීමට යටත් වේ.

(ඇ) **2011 අංක 18 දරන වරයා සහ ගුවන්තොටුපල සංවර්ධන අයකිරීම් පනත :**

මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් තුළින් කරනු ලබන සියලුම ආනයනයන් සඳහා වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම්වලින් නිදහස් වේ.

(ඇ) **2005 අංක 5 දරන මුදල් පනත :**

මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතිය සම්බන්ධව ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම් අදාළ වීමෙන් නිදහස් වේ.

(ඉ) **(235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත :**

මිශ්‍ර උපයෝගීතා ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිතව ව්‍යාපෘති සමාගම සෘජුවම හෝ කොන්ත්‍රාත්කරුවන් මගින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතියට අදාළ සියලුම ආනයනයන් රේගු බදු අයකිරීම් තුළින් නිදහස් වේ.

බැසිල් රෝහණ රාජපක්ෂ, පා. ම.
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2012 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

11 - 623

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.